**National Employment Sourcing & Delivery System**
A Project of the Ministry of Labor Relations and Foreign Employment
Managed by the Ceylon Chamber of Commerce

# News Release

Date: 10/05/2004 **Embargo: 13th Friday, 2005**

Contact:
JobsNet
97, Jawatta Road,Colombo 05.
Tel: 2559961/2 Fax:2559961 Mobile: 0777 707415 Email: dileepa@jobsnet.lk Website: www.jobsnet.lk

## රැකියා පියස සේවා ජාලය මඩකළපුව දක්වා ව්‍යාප්ත වේ.

රැකියා පියස සේවා ජාලය ව්‍යයාප්ත කරමින් මඩකළපු දිස්ත්‍රික් මධ්‍යස්ථානය මෙම මස 14 වන දින කම්කරු සබඳතා හා විදේශ රැකියා නියුක්ති අමාත්‍ය ගරු අතාවුද සෙනෙවිරත්න මැතිතුමා විසින් විවෘත කරනු ලබයි. මෙතෙක් නැගෙනහිර පළාතෙහි අම්පාර හා ත්‍රිකුණාමලය යන දිස්ත්‍රික් තුල රැකියා පියස මධ්‍යස්ථාන පවත්වාගෙන යනු ලැබූ අතර 18වන සේවා මධ්‍යස්ථානය ලෙස මඩකළපුව මධ්‍යස්ථානය විවෘතවේ. දිගුකාලීනව යුධ වාතාවරනයක පීඩා විදි ජනතාවක් වෙසෙන ප්‍රදේශයකට මෙවැනි පහසුකම් රැගෙනයාම තුළින් යම් වෘත්තියක සුවිශේෂි පුහුණුවක් හා පළපුරුද්දක් ඇති අයට රැකියා පියස සමග අත්වැල් බැඳගැනිමට අවස්ථාවක් උදාවේ. එමගින් ඔවුනට හිමි නිසි තැන ලබාදීමට රැකියා පියස කටයුතු කරන අතර පවත්නා සේවා වියුක්තියට සාර්ථක විසඳුමක් ලබාදීම ද අවස්ථාව උදාවී ඇත. රැකියා සඳහා වන දැනුම, කුසලතාවය දියුණු කිරීම හා වෘත්තීය මාර්ගෝපදේශනය ලබා දීම අත්‍යාවශ්‍යය. ඒ සඳහා අවශ්‍ය වන මාර්ගෝපදේශනයද රැකියා පියස මගින් බෙදාදෙනු ලබයි.

ශ්‍රී ලංකාව සඳහා වූ ජාතික රැකියා ප්‍රතිපත්තියෙහි හත් වන ක්‍රියාත්මක පියවර වූ ''රැකියා මුලාශ්‍ර සෙවීමේ හා සැපයීමේ ක්‍රමය ක්‍රීයාත්මක කිරීම'' ක්‍රියාවට නැංවීම රැකියා පියස හරහා සිදුවේ. 2003 ජනවාරි මස ප්‍රථම ප්‍රාදේශිය මධ්‍යස්ථානය කළුතර අගලවත්තේ දී විවෘත කරනු ලැබූ අතර 2003 මැයි මාස පළමු දා අවසාන වන විට දීප ව්‍යාප්ත රැකියා පියස මධ්‍යස්ථාන 17ක් ක්‍රියාත්මක වීම ආරම්භ විය. ඊට නුතන තොරතුරු සංනීවේදන තාක්ෂණයේ සහයද උපරිමව යොදා ගැනුන අතර කේන්ද්‍රගත අන්තර් ක්‍රියාකාරී ජාතික දත්ත පද්ධතියක් ද රැකියා පියස සතුවිය. පරිගණක ගත ජාලයක් මගින් ශ්‍රී ලංකාවේ විවිධ පළාත් තුල පිහිටි ප්‍රදේශීය මධ්‍යස්ථාන එකට සම්බන්ධකර තිබිම කැපී පෙනෙන විශේෂ ලක්ෂණයකි. මෙම සියළුම පහසුකම් මඩකළපු දිස්ත්‍රික් ප්‍රජාව වෙත මැයි මස 14 වන දින සිට අංක 05, අරුණගිරි පටුමග, මඩකළපුව දරණ ස්ථානයේදී ලබාදේ.

කම්කරු සබඳතා හා විදේශ රැකියා නියුක්ති අමාත්‍ය ගරු අතාවුද සෙනෙවිරත්න මැතිතුමා, පුනරුථාපන හා මඩකළපු දිස්ත්‍රික් සංවර්ධන අමාත්‍ය ගරු අමීර් අලී මැතිතුමා ඇතුළු මඩකළපු දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්, රජ්‍ය හා පෞද්ගලික අයතන ප්‍රධානීන්, රාජ්‍ය නොවන සංවිධාන නියේජිතයින් ඇතුළු ආරාධිතයින් රැසක් මෙම උත්සව අවස්ථාවට සහභාගි වේ. උත්සව සභාව හා මහජන හමුව දේවනායගම් ශාලාවේ දී පැවැත්වෙන අතර මෙම අවස්ථාවට සහභාගි වන මෙන් ඔබ සැමට ගෞරවයෙන් ආරාධනා කරමු.